# ශ්‍රී ලාංකේය කලා ශිල්ප තුළ මකර රූපයේ භාවිතය; පාදෙණිය රජමහා විහාරය පිළිබඳ විශේෂ අවධානයක්

ටී.එම්.අයි.එන්. තෙන්නකෝන්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
isurithennakoon92@gmail.com

ප්‍රමුඛ පද: මකරා, සංස්කෘතිය, කැටයම්, සංකල්ප, පාරම්පරික

## හැඳින්වීම

ශ්‍රී ලාංකීය සංස්කෘතික උරුමයේ වැදගත් අංගයක් ලෙස එහි සතු කලා ශිල්ප හඳුන්වාදිය හැකිය. එම කලාශිල්ප තුළ අන්තර්ගත වන සැරසිලි, කැටයම්, හෝ රූකම් සඳහා මකර රුවෙහි භාවිතයක් දක්නට ලැබේ. මකරා වූ කලී මනඃකල්පිත සත්ත්වයෙකි. ස්වභාවික සතුන් කිහිප දෙනෙකුගේ අංග ලක්ෂණවලින් නිර්මිත මකරා කලා කරුවාගේ මනසෙහි ඇති වූ චිත්තරූපයක් සිතුවමට නැඟීමක් යැයි හැඟෙයි. අනාදිමත් කාලයක් පුරාවට අපගේ කලා නිර්මාණයන් තුළට එක්ව තිබෙන මෙම මකර රුව ශ්‍රී ලාංකේය කලා කෘති හා එක් වූයේ කෙසේ ද වෙනත් රටකින් ලක්දිවට සංක්‍රමණය වූ කලා නිර්මාණයක් ද ඉන් කුමක් නිමිති කරන්නේ ද යන්න ගැටළු සහගත වේ. එබැවින් මෙම ගැටළු සහගත තත්ත්වයන් නිරාකරණය කරගැනීම සඳහා මකර සංකල්පය හා මකර රුවෙන් පිළිබිඹු වන සංකේතාර්ථ හා එහි භාවිතයන් පිළිබඳවත් සොයාබැලීම මෙම පර්යේෂණයෙන් අරමුණු කර ගනී. එසේ ම කාලයාගේ ඇවෑමෙන් මකර රුව නිර්මාණය කරන ලද මාධ්‍යයන්ගේ වෙනස්කම් ද දක්නට ලැබෙන හෙයින් ඒ පිළිබඳව ද අධ්‍යයනය කරමින් පාරම්පරික මකර තොරණ නිර්මාණය කරනු ලබන ආකාරය හා එහි නව ප්‍රවණතා සොයබැලීම ද අරමුණු කරගනී. ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිරිහී ගොස් තිබූ අභාග්‍ය සම්පන්න කාලසීමාව නිමාවට පත්වී යළිත් වතාවක් හිස ඔසවන්නට වූයේ මහනුවර යුගයේදී ය. මෙවන් කාලපරිච්ඡේදයක් තුළ පාලකයින්ගේ අනුග්‍රහයෙන් නැවත ප්‍රතිසංස්කරණයට පත්ව චිත්‍ර, මූර්ති හා කැටයම් කර්මාන්තයන්ට නව පණක් ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාදෙණිය රජමහා විහාරය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් එහි ඇති මකර රුවෙහි භාවිතයන් පිළිබඳව සාකච්ඡා කිරීම ද අරමුණු වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී විවිධ ක්‍රම ඔස්සේ ප්‍රාථමික දත්ත හා ද්විතික දත්ත එක්රැස් කරගන්නා ලදී. ඒ අනුව ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ දී නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම වැනි උපක්‍රමයන් භාවිත කරන ලදී. නිරීක්ෂණ යටතේ ඍජු නිරීක්ෂණයන් සිදු කළ අතර මකර රුවෙහි භාවිත හා නව ප්‍රවණතා පිළිබඳ සොයාබැලීම සඳහා අදාළ ක්ෂේත්‍රයට හා ස්ථානයන්ට ගොස් ඡායාරූප හා අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදී. එසේ ම පාදෙණිය රජමහා විහාරයෙහි මකර රුවෙහි භාවිතය සඳහා විශේෂ අවධානයක් යොමු කරන හෙයින් එම ස්ථානයට ද ගොස් අරමුණු හා ගැටළුවට අදාළ දත්ත ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ තවත් ශිල්ප ක්‍රමයක් වශයෙන් සම්මුඛ සාකච්ඡා හෙවත් පුද්ගලයන් හමුවී තොරතුරු විමසා දැනගැනීම සිදුකළ අතර එහි දී

පාදෙණිය රජමහා විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් තොරතුරු ලබාගැනීමට හැකි විය. එමෙන් ම මකර තොරණ නිර්මාණය කරනු ලබන පාරම්පරිකව පැවත එන්නාවූ ශිල්පියෙකු සමග සම්මුඛ සාකච්ඡාවක නිරතවී අවශ්‍ය දත්ත ලබා ගත් අතර මෙම ක්‍රමවේදයන් සාර්ථක කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡාවේ දී අසනු ලබන ප්‍රශ්න කල්තබා සැලසුම් කරගන්නා ලදී.

ද්විතීක දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමයක් වශයෙන් මූලාශ්‍ර අධ්‍යයනය කිරීම සිදුකළ අතර මෙහි දී මකර රූව, මකර සැරසිල්ලට අදාළ තොරතුරු පුස්තකාල අධ්‍යයනයන් තුළින් සපයා ගෙන ඇත. එහි දී විවිධ ග්‍රන්ථ, සඟරා, පුවත් පත් ලිපි, සංරක්ෂණ වාර්තා, පුරාවිද්‍යා හා කෞතුකාගාර දෙපාර්තමේන්තු ප්‍රකාශන යොදාගෙන තිබේ. එමෙන් ම අන්තර්ජාලය මඟින් පර්යේෂණ අරමුණු හා ගැටළුවට අදාළ දත්ත රාශියක් ලබාගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මකර රූව ක්‍රි.පූ. දෙවැනි සියවසේ සිට භාරතයේ භාර්හුත්, සාංචි, මථුරා යන ස්ථාන වල ගල් කැටයම් වල දැකිය හැකිය. එම මකරා සරලය. මෙම මකරාගේ සිට අටවැනි සියවසේ ඉන්දුනීසියාවේ ඇඹූ මකරා දහඅට වැනි සියවසේ මහනුවර ඇඳි මකර රූව අතර විශාල වර්ධනයක් පෙන්වයි. මහනුවර යුගයේ භාවිත කරන ලදැයි සිතිය හැකි රූපාවලිය නම් සංස්කෘත ග්‍රන්ථයෙහි විස්තර වනුයේ වර්ධනය වූ කලාත්මක මකරාය. හින්දු, ජෛන සහ බෞද්ධ සංස්කෘතියේ හා ඔවුන්ගේ නිර්මාණවල මකරාට ලැබෙනුයේ විශේෂ ස්ථානයකි. මකර රූව නිර්මාණයේ ආරම්භය ස්ථාවරව කීමට අපහසු වුවත් ක්‍රි.පූ. දෙවන හෝ තෙවන සියවස්වල දී කිඹුලා මූලික කොටගෙන ග්‍රීක සැරසිලි කලාවේ ආභාසය ඇතිව මකර රූව නිර්මාණය වී ඇති බව දක්විය හැකිය. පසු කාලයේ දී භාරත කලාවේ ආභාසය වූ ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව, කාම්බෝජය ආදී සංස්කෘතීන් තුළ මකරා විවිධ ආකාරයෙන් වර්ධනය වී නොයෙකුත් අන්දමේ විහාර කර්මාන්ත විෂයෙහි භාවිතාවන් සඳහා යොදාගත් බව මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වේ.

මකර රූව කොරවක්ගල්වල යෙදීම හතරවන සියවසේ පමණ ආරම්භ වී තිබේ. මුලින්ම කොරවක්ගල්වල යෙදූ මකර සංකේතය ඉන්පසු මුරගලෙහි දෙපස වූ කණු මත ද, තොරණ සඳහා ද, ස්තූප වටා ඇති වාහල්කඩවල පේකඩවල ද වශයෙන් නිරූපනය කරන්නට විය. කාම දෙවියා ලෙස සැලකෙන අනංගයා මකර ධජය දරන්නෙකු බව දක්වේ. බෝමැඩ දී බුදුරදුන් සමග යුධට ආවේ ද අනංගයා යැයි විද්වත් මතයකි. මේ හේතුවෙන් ගාන්ධාර මූර්තිවල මාරයා දක්වෙන්නේ මකර ධජය සහිතව ය. මකරා කලා කෘතිවලට යෙදීමට ප්‍රථම සංකල්පමය වශයෙන් චීනය තුළ ක්‍රියාත්මක වී තිබේ. චීන මකරා සෞභාග්‍යයත් වාසනාවත් සංකේතවත් කරයි. මකර කැටයම් ඉන්දුනීසියාවේ බෝරෝබුදූර් හා භාරතයේ සාංචි, භාරුත් ආදී ස්ථානවල දැකිය හැකිය. මකර රූව මෙරටට හඳුන්වාදීම සිදු වූයේ මහින්දාගමනයෙන් පසුව බව පිළි ගැනෙයි. ශ්‍රී ලංකාවේ මෙම මකර රූව ප්‍රථමයෙන්ම යොදාගෙන ඇත්තේ මුරගල් හා කොරවක්ගල් රූකම් නිර්මාණ සඳහා බවට සාධක ඇත. ඉන් පසුව සඳකඩපහනෙහි ද බුද්ධ ප්‍රතිමා සඳහා ද වෙහෙර විහාරස්ථානවල ප්‍රවිෂ්ට දොරටුවේ, විහාර මන්දිරය අභියස, බෝධීන් වහන්සේගේ ප්‍රවිෂ්ට ද්වාරය ලෙස ද මෙම මකර තොරණ යොදාගෙන තිබේ. පසුව උළුවහු කැටයම් මෙන් ම සිතුවම් සඳහා ද භාවිත කර ඇත. එසේ ම සැරසිලි මෝස්තර කලාවේ මකර රූව බොහෝ පාරිභෝගික භාණ්ඩවල කැටයම් කර තිබේ. මකර රූව කලා කෘති විෂයෙහි

භාවිතය දෙස විමසිලිමත් වීමේ දී එය ඉතා විශිෂ්ට වූ කලා නිර්මාණාංගයක් ලෙස අගය කළ හැකිය වේ.

මකර රුවෙන් පංචස්කන්ධය හා මනස නිරූපනය කෙරෙන බව දැක්විය හැකිය. රූප-වඳුරු ඇස්, ශබ්ද-උෟරු කන්, ගන්ධ-ඇත් සොඬ, රස-කිඹුල් මුඛය, ස්පර්ශ-සිංහ පාද මගින් සංකේතවත් කරයි. මකර රුව සහිත වූ ගොඩනැගිලි දොරටු අංගයන් මගින් මෙන් ම මෙම මකර රුව භාවිත කලා කෘති මගින් මේ ආකාරයේ ගැඹුරු ධර්මතාවන් මෙන් ම ගැඹුරු සංකේතාර්ථයන් ඉස්මතු වන බව පැහැදිලි වේ.

මුල් අවස්ථාවේ සිට ලාංකීය ඉතිහාසය තුළ එක් එක් යුගයන්හි දියුණුව සමඟ එක් එක් මාධ්‍යයන් වෙනස් වෙමින් භාවිත විය. ලාංකීය කලාකරුවන් අතින් මැටි, දැව, පාෂාණ, ගඩොල්, බදාම, ඇත් දත්, කිරිගරුඬ ආදී බොහෝ මාධ්‍යය වර්ග ඔස්සේ රූකම් නිර්මාණය විය. පසුව සිත්තරුන්ගේ ඇසට පෙනුනු ආකාරය අනුව වර්ණ සංකලනයෙන් යුක්තව එම නිර්මාණ අලංකාර කර තිබේ. පර්යේෂණයෙන් විශේෂ අවධානයක් යොමු කළ මහනුවර යුගයේ නිර්මාණය වූවායැයි සැලකෙන පාදෙණිය රජමහා විහාරයෙහි දක්නට ඇති මකර තොරණ හා මකර කැටයම විශිෂ්ට වූ කලා කෘති සේ ම එම යුගයේ කැටයම් කලාවේ අසමසම බව මැනවින් විද්‍යමාන කරවන නිර්මාණයන් බව මේ ඔස්සේ පැහැදිලි කරගත හැකිය. මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කරනු ලබන මකර රුව හා එහි භාවිත පිළිබඳව ලංකාවේ විවිධ පූර්ව පර්යේෂණ සිදුකර තිබුණ ද එම අධ්‍යයන එතරම් ප්‍රමාණවත් නැති බව පෙනීයයි. එබැවින් මෙම පර්යේෂණය වැදගත් වේ. ඒ තුළින් සමාජය නොදන්නා මෙන්ම වැඩි අවධානයක් යොමු නොවූ මකර සංකල්පය සමඟ බැඳි මකර රුව පිළිබඳව විමර්ශනාත්මකව සොයාබැලීම කාලෝචිත වූවක් ලෙස හැඟිමි.

### ආශ්‍රිත ග්‍රන්ථ


කුමාරස්වාමි, කේ. ආනන්ද (1962) ***මධ්‍යකාලීන සිංහල කලා***, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ගොඩකුඹුරේ, චාල්ස් (1982) ***සිංහල උළුවහු***, කොළඹ

වික්‍රමගමගේ, චන්ද්‍රා (1995) ***ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු***